සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாண கல்வித் திணைக்களம்
Department of Education – Western Province

තෙවන වාර ඇගයීම - 2019
மூன்றாவது தவணை மதிப்பீடு - 2019
Third Term Evaluation - 2019

ශ්‍රේණිය / Grade / தரம் - 11
විෂය / Subject / பாடம் - නර්තනය - පිළිතුරු පත්‍රය
පත්‍රය / Paper / வினாத்தாள் - -
පැය / Hour / மணித்தியாலம் - -

1 පත්‍රය - උඩරට නර්තනය

| අංකය | පිළිතුර | අංකය | පිළිතුර | අංකය | පිළිතුර | අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1 | **4** | 11 | **4** | 21 | **1** | 31 | **1** |
| 2 | **1** | 12 | **1** | 22 | **3** | 32 | **3** |
| 3 | **3** | 13 | **2** | 23 | **2** | 33 | **4** |
| 4 | **3** | 14 | **1** | 24 | **4** | 34 | **3** |
| 5 | **4** | 15 | **3** | 25 | **2** | 35 | **1** |
| 6 | **3** | 16 | **2** | 26 | **1** | 36 | **4** |
| 7 | **2** | 17 | **3** | 27 | **4** | 37 | **2** |
| 8 | **1** | 18 | **2** | 28 | **2** | 38 | **4** |
| 9 | **3** | 19 | **1** | 29 | **3** | 39 | **2** |
| 10 | **4** | 20 | **3** | 30 | **2** | 40 | **4** |

**2 පත්‍රය**

01.

i. යක් ගෙය
ii. එස්. මහින්ද හිමි
iii. දවුල
iv. මයිකුම්
v. 14
vi. ශාන්ත
vii. මිරැන්ඩා හේමලතා
viii. නමස්කාර ගාථා
ix. නාරිලතා
සුරඹාවල්ලිය
x. වර්ණ
හැඩතල

මුළු ලකුණු - 1 බැගින් 12 යි.

02

i. මහ තනි තිතට අයත් බෙර පදයක් නිවැරදිව ප්‍රස්තාර කර තිබේ නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

ii.

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| රො | සිත් | - | ප | හ | ර | දෙ | ති | නි | ර | තු | රු |
| ප | ස | - | මි | තු | - | රු | - | - | එ | දි | න |
| ලෙ | සින් | - | සි | ටි | ති | නො | සැ | ලි | - | ම | ත |
| මෙ | ර | - | අ | යු | - | රු | - | - | - | - | - |

(ලකුණු 04)

iii. දෙතිතට අයත් වන්නමක කවි පද දෙකක් නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න

විභාග කර දැක්වීමක් සහ සංකේත සඳහා - ලකුණු 02
නිවැරදි ව බෙර පදය හෝ කවි පද ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

(මුළු ලකුණු = 12 යි.)

03.

ප්‍රශස්ති

- ආරම්භය කෝට්ටේ යුගයේ බව,
- මහනුවර යුගයේ කවිකාර මඩුවේ දී රචනා වූ බව,
- පළමු ප්‍රශස්ති කාව්‍ය 'පැරකුම්බා සිරිත' බව,
- බුද්ධ ප්‍රශස්ති, දේව ප්‍රශස්ති, රාජ ප්‍රශස්ති ලෙස ප්‍රශස්ති වර්ග තුනක් පැවතෙන බව,
- වන්දිභට්ටයන් විසින් ගායනා කළ බව,
- ගායනා කළ අයට රජු විසින් ගම්වර හා තාන්න මාන්න ලබා දුන් බව,
- පසුකාලීනව සාම්ප්‍රදායික නර්තන යොදාගනිමින් ශාස්ත්‍රීය අංගයක් බවට පත්වූ බව,
  උදා:- ශ්‍රී නාමය, පවන, ශ්‍රීංගාරය, රාජසිංහ විරුදාලිය (ලකුණු 04)

තුන්තිත

- තාල රූප තුනක් එකතු වී නිර්මාණය වී ඇති බව,
- තාල තැබීමේදී තාලම්පට යොදා ගන්නා බව,
- සංකේත ^ ^ / ලෙස භාවිතා වන බව,
- ප්‍රචලිත තුන් තිතේ ප්‍රභේද දක්වා තිබීම,
  උදා:- දෙසුළු මැදුම් තුන්තිත, දෙ සුලු මහ තුන් තිත
- එම තිතට අයත් නර්තන අංග දක්වා තිබීම,
  උදා - මයුරා වන්නම, කුදාංත ගත දොං වට්ටම (ලකුණු 04)

මුද්‍රා නාට්‍ය කලාව

- රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ ලංකාගමන සන්ධිස්ථානයක් වූ බව,
- වාචික අභිනයෙන් තොරව රඟදක්වන නාට්‍ය සම්ප්‍රදායක් බව,
- ශිල්පීන් හා ඔවුන්ගේ නාට්‍ය නිර්මාණ දක්වා තිබීම,
- 50 - 70 දශකය ස්වර්ණමය යුගය බව,
- ලංකාවේ ප්‍රථම මුද්‍රානාට්‍ය 'සිතාහරණ' බව,
  උදා- චිත්‍රසේන - කරදිය, නල දමයන්ති, රාම සීතා, රාවණා, විදුර
  වජිරා චිත්‍රසේන - රන් කිකිළි, ගිනිහොරා, හපනා, නිල් යකා
  ප්‍රේමකුමාර එපිටවෙල - සැළලිහිනිය, තිත්ත බත, පරවිය, ගමන
  එස්. පණීභාරත - සත්පත්තිනි, ග්‍රහ අපලය, මහවැලි (ලකුණු 04)

<u>නාට්‍යමය පෙළපාලි</u>

- ශාන්තිකර්මවල නාට්‍යමය පෙලපාලි ඇතුළත් කිරීමේ අරමුණු -
    - හාස්‍ය රසය මතු කිරීමට
    - විඩාබර බව දුරු කිරීමට
    - ප්‍රේක්ෂකයන් මඩුපොලේ හි රඳවා ගැනීමට
    - ප්‍රේක්ෂකයන් නිදි වර්ජිතව තබා ගැනීමට
- නාට්‍යමය පෙලපාලි ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතාවට සම්බන්ධතාවයක් ඇති බව,
- සමාරෝපනය, දෙබස්, සංවාද, අනුකරණය, නර්තනය, ගායනය, වාදනය යොදාගනිමින් නාට්‍යමය අවස්ථා තීව්‍ර කළ හැකි බව,
- නාට්‍යමය අවස්ථාවලට උදාහරණ දක්වා තිබීම,
- පහත රට නර්තන සම්ප්‍රදායේ නාට්‍යමය පෙළපාලි විචිත්‍රත්වයෙන් වැඩි බව, (ලකුණු 04)

<u>ද්‍රවිඩ ගැමි නැටුම්</u>

- සිංහල ගැමි නැටුම් මෙන්ම දමිළ සංස්කෘතිය විදහා දැක්වෙන බව,
- සුවිශේෂීතා වලින් යුක්ත බව -
    - විසිතුරු බව
    - රංගවස්ත්‍රාභරණ වල, රංග උපකරණ වල නර්තන චලනවල සුවිශේෂතා දක්වා තිබීම
- සිංහල ගැමි නැටුම් හා නාමික ව සමානතා දක්වා තිබීම, (ලකුණු 04)

(මුළු ලකුණු 4 x 3 = 12 යි.)

04.

i. කප් සිටුවීම
මඩු පේ කිරීම
හඟල පේ කිරීම
තොට පේ කිරීම
මල පේ කිරීම යන චාරිත්‍ර විධි දෙකක් පිළිබඳව කෙටියෙන් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

ii.

**<u>කොහොඹා කංකාරිය</u>**
ගුරුගේ මාලාව
යක්කම් පහ (උරා, වැදි, නයා, බොරු, සීතා/ දර්ශන)
ගබඩා කොල්ලය

**<u>දෙවොල්මඩුව</u>**
දෙවොල් ගොඩබැසීම
අඹ විදමන
ඇත් බන්ධනය
මී බන්ධනය

**<u>පහන් මඩුව</u>**
දෙවොල් ගොඩබැසීම
අසුර යක්කම
රාමා මැරීම
පොක්කඩේ පාලිය

සම්ප්‍රදායට අනුව නිවැරදිව නාට්‍යමය පෙළපාලි දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

iii.

- සමානතා සංකල්පය ඉස්මතු වන බව,
- තරාතිරම නොබලා හැකි පමණින් දායකත්වය ලබාදෙන බව,
- පොදු අරමුණු ඉටුකර ගැනීමට හැකි බව,
උදා:- සශ්‍රීකත්වය, රෝග නිවාරණය

- ආගන්තුක සත්කාරය ඉස්මතුවන බව,
- සම අසුන් වල සිට නැරඹීම සිදුවන බව,
- ශාන්ති කර්ම ශිල්පීන් අතරේ ආචාර සමාචාර පවතින බව,
- උපත් කථා මගින් ආදර්ශ ලබා දෙන බව,
- වැඩිහිටියන්ට ගරු කිරීම.
  උදා - ශාන්තිකර්ම ශිල්පීන් සහමහළු පිළිවෙලට රංග භූමියට පිවිසීම. (ලකුණු 04)

(මුළු ලකුණු = 12 යි.)

05.

i.

- අරමුණු වල සමානතා
  - i. අතීත :- පූජාර්ථය, සශ්‍රීකත්වය, විනෝදාස්වාදය
  - ii. වර්තමාන :- සමාජ විවරණය, සමාජ ශෝධනය, අධ්‍යාපන කාර්යය සඳහා
- සියලුම චරිත පිරිමින් විසින් රඟ දක්වන බව
- හාස්‍යෝත්පාදක දෙබස් හා සංවාද ඇතුලත් බව

(ලකුණු 04)

ii.

- කමත රංගභූමිය ලෙස යොදා ගන්නා බව,
- රංග භූමිය වටා ලණු, ගොප් රැහැන් ඇද සීමා පැන වූ බව,
- ප්‍රේක්ෂකයන් රංග භූමිය වටා බිම වාඩිවී නරඹන බව,
- රංග සැරසිල්ලක් වූ පහන් පැලක් ඉදිකරන බව,
- රංගභූමිය මධ්‍යයේ මුනින් අතට හැරවූ වංගෙඩියක් තිබෙන බව,
- විදුලිය නොමැති හෙයින් ආලෝකය ලබාගැනීමට ලන්තෑරුම් හා චිමිනි ලාම්පු දල්වන බව,
- පසෙකින් එල ඇති අඹ අත්තකින් සැරසීම (පත්තිනි දේව සංකල්පය සනිටුහන් කිරීමට) (ලකුණු 04)

iii.

<u>චලන</u>

- පහසුවෙන් ඕනෑම අයෙකුට ග්‍රහණය කරගත හැකි බව,
- ගැමි ජීවිතයේ ක්‍රියාකාරීත්වයන්ට සමීප බව,
- රංග උපකරණ ඇසුරෙන් චලන දක්වන බව,

<u>ගායනා</u>

- වැඩි වශයෙන් තනි තිතේ තාල රූප මත බිහිවන බව,
- ව්‍යවහාරික භාෂාව යොදා ගනිමින් සරල බස් වහරකින් නිර්මාණය වී ඇති බව,
- නාදමාලාව තේමාවට අදාළ ක්‍රියාකාරකම් අනුව නිර්මාණය වී ඇති බව,
  (රංග උපකරණ භාවිතය වාදනය රංග රංගවස්ත්‍රාභරණ ආදී ගැලපෙන කරුණු දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.) (ලකුණු 04)

(මුළු ලකුණු = 12 යි.)

06.

i. **<u>සමානතා</u>**

- පරිමාණ ලක්ෂණ දිගින් සමාන වීම,
- බෙර ඇසේ සණකම,
- වාදනය කරන අවස්ථා,
- දැව වර්ග වල සමානතා,
- බෙරයේ කොටස් වල දක්නට ලැබෙන සමානතා,
- ආතත ගණයට අයත් වාද්‍ය භාණ්ඩ දෙකක් වීම,

අසමානතා

- හැඩයේ සමානතා,
- බෙර ඇසට යොදා ගන්නා සම් වර්ග,
- ඇතැම් කොටස්වල පරිමාණ ලක්ෂණ අසමාන වීම.
  උදා.:- බෙර ඇස, වරපට, කැපුම් හම
- බීජාක්ෂර වල අසමානතා, (ලකුණු 04)

ii. කථකලි

- ආගමික ජන නාටක තුළින් ප්‍රභවය ලැබීම.
- රාමායණය / මහා භාරතය කතා රඟදැක්වීම (ආගමික කථා පුවත්)
- බ්‍රාහ්මණයාට සුවිශේෂ වීම.
- කෝවිල් ආශ්‍රිතව රඟදැක්වීම.
- භක්ති ගීත නර්තනය සඳහා යොදා ගැනීම. (ලකුණු 04)

iii. තාලම්පට

- තාල තැබීමේ පොදු වාද්‍ය භාණ්ඩයක් බව,
- පංචතූර්ය වාදනය වන ඝන කොටසට අයත් බව,
- තිත් / තෙයි නම් ධ්වනි දෙකක් නිකුත් වන බව,
- ගැමි නර්තනයේ දී රංග උපකරණයක් ලෙස ද තාලම් නැටුමේදී භාවිත කරන බව, (ලකුණු 04)

(මුළු ලකුණු = 12 යි.)

07.

i.

- නායකත්වයට ගරු කරන බව,
- එකිනෙකාට උදව් කර ගන්නා බව,
- සාමූහික නර්තනයෙහි යෙදෙන බව,
- ශිල්පීය දක්ෂතා අගයන බව,
- වින්දන ශක්තිය තුළින් දුර්ගුණාංග පහකර ගැනීමට හැකි බව,
- මානසික ස්වස්ථතාව තුළින් ආකල්ප වර්ධනය වන බව,
- කාලය ඵලදායි ලෙස ගත කිරීමට හැකි බව,

ආදී වශයෙන් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

ii.

- බොහෝවිට මුදලේ වටිනාකම මත නිර්මාණ හා නර්තන ශිල්පීන් ඇගයීම සිදුකරන බව,
- ඒ අනුව වත් පොහොසත් කම් මත දක්ෂතාවයන් යටපත් වන බව,
- සාම්ප්‍රදායික නර්තන අංග වලන නොව ප්‍රේක්ෂකයන්ගේ රුචිකත්වයට අනුව විදේශීය ආභාෂයන් මත බිහිවන නර්තනයන්ට මුල් තැනක් හිමි වන බව,
- ජයග්‍රහණය කරන නර්තන ශිල්පීන් හෘද සාක්ෂියට අනුව තෘප්තිමත් නොවන බව,
- උසස් කලා කෘති ඇගයීමට පසුබිමක් නොවන බව, (ලකුණු 04)

iii.

- රබීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ ලංකාගමනය මූලාරම්භය බව,
- ඉන්දු - ලංකා ශිෂ්‍යත්ව ක්‍රමය නිසා භරත, කථක්, කථකලි, මනිපුරි නර්තන හැදෑරීමට අවස්ථාව සැලසෙන බව,
- මුද්‍ර නාට්‍ය කලාව බිහි වූ බව,
- නව නිර්මාණ නර්තන බිහිවූ බව,
- චලන / රංගවස්ත්‍රාභරණ / සංගීතයේ ආභාෂය ලැබූ බව,
- ජාත්‍යන්තර උළෙලවල් සඳහා දේශීය නර්තන කණ්ඩායම් සහභාගි වූ බව,
- ඉන් දේශීය නර්තන ලෝකයට හඳුන්වාදීමට අවකාශය සැලසෙන බව,
- විදේශීය ආභාෂය (රංග වින්‍යාසය, ආලෝකකරණය, රංගවස්ත්‍රාභරණ, පසුතල නිර්මාණය, චලන

සංගීතය (ගායනය / වාදනය) (ලකුණු 04)

(මුළු ලකුණු = 12 යි.)